සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
# චිත්‍ර කලාව


**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

## I කොටස

- පහතදැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01 ඉහත දැක්වෙන රූපයෙන් ...................................................... දැක්වේ.

02 උල් වූ තුඩක් සහිත ගෝලාකාර විශාල ශිඛරය ...................................................... නමින් හැඳින්වේ.

03 මෙම ගොඩනැගිල්ල දෙපස ඉදිකර ඇති කුළුණු ද එහි ගෘහ නිර්මාණවලට අයත්වන අතර ඒවා ...................................................... යනුවෙන් හඳුන්වයි.

04 සැම කුළුනකම මුදුනෙහි අඩ සඳ හා ...................................................... සංකේත මූර්තිමත් කර ඇත.

05 ඉස්ලාම් ආගමික ග්‍රන්ථය වන ...................................................... ඇති පාඨ අරාබි බසින් මෙහි බිත්ති මත සටහන් කර ඇත.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06 හින්දු ආගමික සංකේතය ලෙස භාවිතා කරන්නේ,

(1) වෘෂභ කොඩියයි. (2) ඇත් කොඩියයි.

(3) සිංහ කොඩියයි. (4) අශ්ව කොඩියයි.

07 තෛපොංගල් උත්සවය සමරනු ලබන්නේ,

(1) පෙබරවාරි මාසයේදී ය. (2) මාර්තු මාසයේදී ය.

(3) ජනවාරි මාසයේදී ය. (4) දෙසැම්බර් මාසයේදී ය.

08 රාමසාන් උත්සවයේ දී උපවාස කාලය අවසන් වන්නේ,

(1) හිරු උදාවෙන් පසුවය.

(2) නව සඳ දැකීමෙන් පසුවය.

(3) දේවස්ථානයට ගොස් යාච්ඤා කිරීමෙන් අනතුරුව ය.

(4) කුරාණය පාරායනයෙන් පසුවය.

09 වෙල් කදුරු ගෙඩි හා නාවා ගස්වල ගෙඩි පහන් සඳහා භාවිතා කරනු ලබන්නේ,

(1) නත්තල් උත්සවයේදී ය. (2) තෛපොංගල් උත්සවයේදී ය.

(3) රාසමාන් උත්සවයේදී ය. (4) වෙසක් උත්සවයේදී ය.

10 චෛත්‍යවල හතරැස් කොටුව නමින් හඳුන්වන අංගය හර්මිකාව ලෙස හඳුන්වන්නේ,

(1) රුවන්වැලිසෑයේ ය. (2) සාංචි ස්තූපයේ ය.

(3) ජේතවනාරාමයේ ය. (4) රන්කොත් වෙහෙරේ ය.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වචනවල A තීරුවට ගැළපෙන නිවැරදිම වචනය B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 11 | ගෝපුරම් | (a) | වෙසක් උත්සවය |
| 12 | ආමිස පූජාව | (b) | හින්දු කෝවිල |
| 13 | සටාකාර | (c) | රාමසාන් උත්සවය |
| 14 | සච්මි | (d) | තෛපොංගල් උත්සවය |
| 15 | කෝලම් රටා | (e) | බෞද්ධ ස්තූපය |

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වාක්‍ය හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වාක්‍ය බදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16 විවිධ මාධ්‍ය හෝ ද්‍රව්‍ය නිශ්චිත හැඩයකට අනුව සම්බන්ධ කරන නිර්මාණ එකලස් කිරීම ලෙස හඳුන්වයි. (    )

17 පංති කාමරයේදී ඇඹීමේ කාර්යය සඳහා පහසුම මාධ්‍ය සිමෙන්ති බදාමයි. (    )

18 පොත් පිටකවර නිර්මාණය ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් නොවේ. (    )

19 කොළ වර්ණය ද්විතීයික වර්ණයකි. (    )

20 වර්ණවත් කඩදාසි ඉරා අලවා ගැනීමෙන් කරනු ලබන නිර්මාණ කොලාජ් ලෙස හඳුන්වයි. (    )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **චිත්‍රයේ පසු පිටෙහි ඔබේ විභාග අංකය / නම, පංතිය හා චිත්‍රයේ මාතෘකාව හෝ අංකය සඳහන් කරන්න.**
- **පහත සඳහන් මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.**

01 අම්මා නංගී නලවල හැටි

02 වෙසක් පොහොයදා ගමේ පන්සල

03 වෙළඳ පොළක වෙළඳුන් හා බඩු ගැනීමට පැමිණි පිරිසක්

04 ''අලි පැංචා'' නැමැති ළමා කතන්දර පොතකට පොත් පිටකවරයක් අඳින්න.

05 ප්‍රධාන වර්ණ හතරක් පමණක් යොදාගෙන චීත්ත රෙද්දකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

06 පරිසරයේ ඇති ශාක පත්‍රයක හා මලක හැඩයක් යොදාගනිමින් ව්‍යාප්ත මෝස්තරයක් අඳින්න.

(ලකුණු 60 යි)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | මුස්ලිම් පල්ලිය / මස්ජිදය | 02 | කුණා | 03 | මිනාර් / මිනරෙට් | 04 | තරුව |
| 05 | අල් කුරාණය / කුරානය | 06 | වෘෂභ කොඩිය | 07 | ජනවාරි මාසය | | |
| 08 | නව සඳ දැකීමෙන් පසුවය | 09 | වෙසක් උත්සවය | 10 | සාංචි ස්තූපය | | |
| 11 | හින්දු කෝවිල (b) | 12 | වෙසක් උත්සවය (a) | 13 | බෞද්ධ ස්තූපය (e) | | |
| 14 | රාමසාන් උත්සවය (c) | 15 | තෛපොංගල් උත්සවය (d) | 16 | ✓ | 17 | ✗ |
| 18 | ✗ | 19 | ✓ | 20 | ✓ | | |

(සෑම පිළිතුරකටම ලකුණු 2 බැගින් ලබාදෙන්න.) (2 x 20 = 40)

I කොටසට ලකුණු 40 යි.

II කොටසට ලකුණු 60 යි.

මුළු ලකුණු 100 යි.